# "තරුණ ඇසින් - වැඩිහිටි භාවය " වැඩිහිටි භාවය පිළිබඳව තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන

## උපදෙස් මාලාව -2025.

**හැඳින්වීම:-**

සමාජය පිරිහීමේ ප්‍රතිඵලයක් වශයෙන් තරුණ ප්‍රජාව හා වැඩිහිටියන් අතර අන්තර් සම්බන්ධතාවය බිඳවැටී ඇති අතර, සංකීර්ණ සමාජ ක්‍රමය තුළ වැඩිහිටි භාවය පිළිබඳ තරුණ ප්‍රජාව දැනුවත් කිරීම අවශ්‍යය වේ. තවද, තරුණ ප්‍රජාව විවාහ වීම තුල වෙන් වූ පවුල් සංස්ථාවක් ගොඩනැගේ. ඒ අනුව දෙමාපියන් හා දරුවන් අතර දේපළ බෙදී යෑම, දරුවන් විසින් වයස්ගත වූ දෙමාපියන් රැකබලා ගැනීම ආදි කරුණු වලදී විවිධ වූ ගැටළු මතු වේ. වැඩිහිටියන් මහ මඟට ඇඳ දැමීම, වැඩිහිටි නිවාස තුළට යොමු කිරීම ආදි තත්ත්වයන් උද්ගත වේ. මෙම තත්ත්වය නැති කිරීම හෝ අවම කිරීමේ හැකියාව ඇත්තේ තරුණ වියේදීම ඔවුන් දැනුවත් කිරීම හාතරුන ප්‍රජාව ඔවුන්ගේ වැඩිහිටි දිවිය සැලසුම් කිරීම පිළිබඳ අවබෝධයක් ලබාදීම තුළින්ය. මූලික වශයෙන් වැඩිහිටියන් රැකබලා ගැනීම, වැඩිහිටින්ට ගරුකිරීම, ඔවුන් පිළිබඳ යහපත් ආකල්ප තරුණයන් තුළ ඇති කිරීමටත් තම වැඩිහිටි දිවිය සැලසුම් කර ගන්නා ආකාරය පිළිබඳවත් දැනුවත් කිරීමට මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි

**අරමුණ :-**

ගිලිහී යන සාරධර්ම හමුවේ දැයේ තරුණ ප්‍රජාව වෙත වැඩිහිටියන් පිළිබඳ අවබෝධයක් ලබා දීමටත්, වැඩිහිටි භාවය පිළිබඳ යහපත් දැක්මක් හා ඔවුන් අතර අන්තර් සම්බන්ධතාවය ගොඩනැංවීමත් අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන දියත් කරනු ලබයි.

**වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**

- ❖ දිස්ත්‍රික්කයක එක බැගින් සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.
- ❖ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් ලබා ගන්නා ඉල්ලීම් පදනම් කරගනිමින් වැඩසටහන සඳහා මුදල් නිදහස් කරනු ලැබේ.
- ❖ වැඩසටහන සඳහා උපරිම වශයෙන් රු .85,000.00 ක මුදලක් එක් දිස්ත්‍රික්කයක් වෙත ලබා දෙනු ලබයි.
- ❖ දිස්ත්‍රික්කය තුළ පිහිටි තරුණ සංවිධානයක් හෝ සංවිධාන කිහිපයක් වැඩසටහන සඳහා තෝරා ගත යුතුය.
- ❖ ඔබ විසින් තෝරාගත් තරුණ සංවිධානයක් හෝ සංවිධාන කිහිපයක වයස අවුරුදු 18-35 අතර තරුණ තරුණියන් අවම වශයෙන් 100 දෙනෙකු මෙම වැඩසටහන සඳහා සහභාගී කරවිය යුතුය.
- ❖ වැඩසටහන පැවැත්විය යුතු අවම කාලය පැය හයක් විය යුතු අතර, පහත සඳහන් මාතෘකා ආවරණය කළ යුතුය
    - වැඩිහිටියා, වැඩිහිටි භාවය හා නිරෝගී සුව පිරුණ වැඩිහිටි වියට පෙර සූදානම -

        වැඩිහිටියා හැඳින්වීම, වැඩිහිටිභාවය හැඳින්වීම, වැඩිහිටිවියේ දි වැලඳෙන බෝ නොවන රෝග හඳුනා ගැනීම වැළකීම හා ආරක්ෂා වීම.

    - සුරක්ෂිත වැඩිහිටිවියයි - සැලසුම්ගත අනාගත අයෝජනයයි -

        ආර්ථික වශයෙන් සාර්ථකව වැඩිහිටි වියට මුහුණ දිමට සැලසුම්, සමාජයීය වශයෙන් සැලසුම් සහගතව මුහුණ දිම

    - වැඩිහිටි භාවය වෙනුවෙන් තරුණ අපේ යුතුකම් හා වගකීම්-

        වැඩහිටියාගේ ස්වාධීනත්වය, සහභාගීත්වය, ආරක්ෂාව, ආත්ම අභිමානය

- ❖ සම්පත් දායකයින් තෝරා ගැනීමේදී උක්ත මාතෘකා සඳහා දැනුම ඇති සුදුසු නිලධාරීන් තෝරාගත යුතුය

❖ මෙම වැඩසටහන සඳහා සම්පත් දායකයින් තෝරා ගැනීමේදී හා දීමනා ගෙවීමේදී රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අංක 07/2025 හා 2025.03.17 දිනැති චක්‍රලේඛන අනුව කටයුතු සිදු කළ යුතුය.

❖ මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි සේවය කරන වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරී (වැඩිහිටි) / සමාජ සේවා නිලධාරි / සංවර්ධන නිලධාරි (සමාජ සේවා ) විසින් සිදු කළ යුතු වේ.

❖ වැඩසටහන සඳහා මුදල් ප්‍රතිපාදන යොමු කර මාස තුනක් ඇතුළත හෝ 2025.11.30 වන දිනට යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනට ප්‍රථම පවත්වා අවසන් කළ යුතුය.

- **අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම**

❖ මුදල් ලැබීම් කුවිතාන්සි පත (පොදු 172) මුදල් ලැබී දින 14 ක් ඇතුළත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.

❖ වැඩසටහන පවත්වා අවසන් වූ වහාම ඒ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය සහිත සවිස්තර වාර්තාව NSE/DEV/FO/ 003/I (ඇමුණුම 03) ආකෘතියට අනුව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය

ඇමුණුම 02

# "තරුණ ඇසින් වැඩිහිටි භාවය " වැඩිහිටි භාවය පිළිබඳව තරුණ ප්‍රජාව දැනුවත් කිරිමේ වැඩසටහන

## ඉල්ලීම් ආකෘති පත්‍රය - 2025

1. දිස්ත්‍රික්කය :- ..........................................................................................................
2. පැවැත්වීමට අපේක්ෂිත දිනය :- ..........................................................................................................

3. සහභාගීත්වය

| අනු අංකය | ආයතනය | සහභාගි වන සංඛ්‍යාව |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

4.යොජිත දළ ඇස්තමේන්තුව

| අනු අංකය | විස්තරය | ඇස්තමේන්තු ගත මුදල (රු) |
|---|---|---|
| 01 | සම්පත්දායක දීමනා | |
| 02 | සංග්‍රහ වියදම් | |
| 03 | වෙනත්<br>1.<br>2.<br>3 | |
| එකතුව | | |

සකස් කළේ :- ..........................

විෂය භාර නිලධාරි
නිල මුද්‍රව

නිර්දේශ කළේ :-.........................

සහකාර දිස්ත්‍රික් ලේකම්/
පරිපාලන නිලධාරි
නිල මුද්‍රව

අනුමත කළේ :- ....................

දිස්ත්‍රික් ලේකම්
නිල මුද්‍රව